# කාර්යසාධන වාර්තාව 2023

# செயலாற்றுகை அறிக்கை 2023

# Performance Report 2023

ශීර්ෂය - 102

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති

අමාත්‍යාංශය

## தலைப்பு - 102

## நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

## Head - 102

## Ministry of Finance, Economic Stabilization and National Policies



# කාර්යසාධන වාර්තාව

# 2023

**ශීර්ෂය - 102**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති

අමාත්‍යාංශය

**2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**
**වැය ශීර්ෂ අංකය: 102**


01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 3

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 8

03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය ........ 10

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක ........ 16

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 17

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ........ 19

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ........ 21

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කැබිනට් අමාත්‍යාංශයකි.

එමඟින් රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තහවුරු කරනු වස් ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා රටෙහි ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය, යෝජනා කිරීම සහ ඇගයීම ප්‍රධානම වශයෙන් සිදු කෙරේ.

මේ වන විට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතර කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා භාණ්ඩාගාර ලේකම් ලෙස කටයුතු කරනු ලැබේ.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**දැක්ම**

“කඩිනම් සංවර්ධනය සහ ආයෝජනය සඳහා පහසුකම් සලසන ආර්ථික පසුබිමක් තුළින් නව ශ්‍රී ලංකාවක්”

**මෙහෙවර**

“මහජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලබාදෙන බවට සහතික වීම පිණිස ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්යක්ෂම ලෙස හා විනිවිද භාවයෙන් යුක්තව රටේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, යෝජනා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.”

**අරමුණු**


- රටේ ජාතික ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම හා සාර්ව මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය.
- ජාතික සංවර්ධන සැලසුම සකස් කිරීම හා මූල්‍ය සම්පත් කළමනාකරණය.
- ජාතික බදු ප්‍රතිපත්තිය කළමනාකරණය හා රාජ්‍ය ආදායම ඵලදායී ලෙස භාවිතා කිරිම.
- ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධීකරණය කරමින් මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ආර්ථික සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයට පහසුකම් සැලසීම.
- ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම හා ඵලදායි භාවිතය තහවුරු කරමින් විදේශ සම්පත් සංචලිකරණය.
- ඒකාබද්ධ අරමුදල පවත්වාගෙන යාම හා ඒ සඳහා ගිණුම්ගත කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රටේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- මූල්‍ය හා බදු ගණනය විෂයයට සම්බන්ධ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යටතට ගැනෙන එකී විෂයන්හි ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම අධීක්ෂණය සහ ඇගයීම.
- සාර්ව මූල්‍ය කළමනාකරණ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- මූල්‍ය සම්පත් කළමනාකරණය සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම.
- අයවැය පිළිබඳ මූල්‍ය පාලනය බලාත්මක කිරිම සහ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආදායම් ඵලදායී ලෙස භාවිතා කිරිම සහ ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම.
- රජයේ මූල්‍ය රෙගුලාසි බලාත්මක කිරීම.
- ඒකාබද්ධ අරමුදල කළමනාකරණය.
- රාජ්‍ය වියදම් කළමනාකරණය.
- රජයේ ප්‍රසම්පාදන උපදේශාත්මක සේවා.
- දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය මුදල් පාලනය කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා මත පදනම් වූ භාණ්ඩාගාර රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල කළමනාකරණ විගණනය උසස් කිරිම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
- සේවක සංඛ්‍යා කළමනාකරණය.
- ආයතන වලට පවරන ලද අනෙකුත් සියලුම විෂයයන්ට සම්බන්ධ කරුණු.
- ආයතන අධීක්ෂණය.

## 1.4 සංවිධාන සටහන



## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

01 මහා භාණ්ඩාගාරය
02 ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
03 ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
04 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
05 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
06 ජාතික අයවැය දෙපාර්තමේන්තුව
07 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
08 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
09 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
10 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
11 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
12 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
13 නීති කටයුතු දෙපාර්තමේන්තුව
14 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
15 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
16 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
17 කොම්පට්‍රෝලර් ජනරාල් කාර්යාලය
18 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
19 ශ්‍රී ලංකා රේගුව
20 සුරාබදු දෙපාර්තමේන්තුව
21 තක්සේරු දෙපාර්තමේන්තුව
22 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
23 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
24 විදුලි සංදේශ දෙපාර්තමේන්තුව
25 අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව

## 1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

01 රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව
02 ජාතික ලොතරැයි මණ්ඩලය
03 සංවර්ධන ලොතරැයි මණ්ඩලය
04 ශ්‍රී ලංකා මහ බැංකුව
05 සියළුම රාජ්‍ය බැංකු, මූල්‍ය ආයතන. රක්ෂණ සමාගම්, හා ඒවායේ පාලිත සමාගම් හා ආශ්‍රිත ආයතන
06 ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
07 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්
08 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
09 ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසම
10 ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ සමීක්ෂණ මණ්ඩලය
11 ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
12 ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
13 නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
14 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

15 ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
16 බදු අභියාචනා කොමිෂන් සභාව
17 ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
18 තිරසර සංවර්ධන සභාව
19 සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
20 රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගමය
21 වර්ජන, කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල
22 ජාතික රක්ෂණ භාර අරමුදල
23 සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
24 ලෝහෝර් ආර්යා අරමුදල
25 වනජීවී භාරය
26 ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය
27 මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
28 සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
29 දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල

**ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම (ඉවත් කිරීම) පනත යටතේ මහාභාණ්ඩාගාරයේ ලේකම්වරයා සතු කර ඇති ආයතන**

30 ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන
31 කලම්බු ලෝටස් ටවර් මැනේජ්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
32 නෝර්ත් සී ලිමිටඩ්
33 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
34 ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
35 ජාතික ලුණු සමාගම
36 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
37 පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්
38 සීමාසහිත බී.සී.සී.සමාගම
39 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
40 මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි-සිනමා උද්‍යානය
41 සීමාසහිත ලංකා ජෙනරල් ට්‍රේඩිං සමාගම
42 සහස්‍යා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
43 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

## 1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

| | (අ) ව්‍යාපෘතියේ නම | (ආ) දායක නියෝජිතායතනය | (ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මි. | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|
| 01 | සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) | ලෝක බැංකුව | ඇමෙරිකන් ඩොලර් මිලියන 75 | අවුරුදු 02 |
| 02 | මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය(FSMP) | ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) | ඇමෙරිකන් ඩොලර් මිලියන 75 | අවුරුදු 05 |

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.1.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 වසර සඳහා අයවැය යෝජනා 120 ක් ඉදිරිපත් කර ඇත. එම යෝජනා වලින් ආදායම් යෝජනා 32 ක් ද, වියදම් යෝජනා 30 ක්, ප්‍රතිපත්ති යෝජනා 58 ක් ද ඇතුළත් වේ. 2023 වසර අවසන් වනවිට මෙම යෝජනා 120 න් ආදායම් යෝජනා වලින් 84% ක් අවසන් කර ඇති අතර, යෝජනා වලින් 16%ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. වියදම් යෝජනා වලින් බෙහෝමයක් වෙනත් අමාත්‍යාංශ හා ආයතන වලින් ක්‍රියාත්මක කරමින් පවතින අතර එම ව්‍යාපෘති වලින් 90% ක් මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. එසේම ප්‍රතිපත්ති යෝජනා වලින් 24% ක් අවසන් කර ඇති අතර 52% ක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

2022 වර්ෂයේ ආරම්භයේදී උද්ගත වූ විදේශ විනිමය අර්බුදය නිසා ඇති වූ අභියෝගාත්මක තත්වය 2023 වර්ෂයේදී මැඩපවත්වමින් දුෂ්කරතා හැකිතාක් අවම කරගනිමින් ජන ජීවිත සාමාන්‍ය පරිදි පවත්වා ගැනීමට හැකිවන පරිදි ආර්ථිකය මෙහෙයවීම අප අමාත්‍යාංශය ලද ජයග්‍රහණයකි.

2022 වර්ෂයේ සිදු කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණය සහ ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් 2023 වර්ෂයේ සමාජ ආර්ථික තත්වය කළමනාකරණය කර ගැනීමට හැකි විය.

2022 වසරේදී මුහුණ දුන් ඉන්ධන, ගෑස් හා පොහොර හිඟය සඳහා 2023 වර්ෂය වන විට විසඳුම් සොයාගැනීමට හැකි වීම අප අනුගමනය කරන ප්‍රතිසංස්කරණ වල සාර්ථකත්වයට උදාහරණයකි.

පසුගිය 2023 වසරෙහි අභියෝගාත්මක ආර්ථික තත්වය යටතේ පහත දැක්වෙන ජයග්‍රහණ අත් කරගෙන ඇත.

- රාජ්‍ය බදු ප්‍රතිපත්තියෙහි ප්‍රතිසංස්කරණ සිදු කරමින් පැවතීම.
- බදු ආදායම් වර්ධනය වීම.
- උද්ධමනය 2023 වසරේ ඔක්තෝම්බර් වන විට 1.5% දක්වා අඩු කර ගැනීමට හැකි වීම.
- විදේශ විනිමය සංචිතය ඉහළ යාම.
- රාජ්‍ය සේවක වැටුප් හා විශ්‍රාම වැටුප් වල ජීවන වියදම් දීමනා ඉහළ දැමීමට යෝජනා ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය සේවක ආපදා ණය සියළු රාජ්‍ය සේවකයින්ට නැවත ගෙවීමට යෝජනා ඉදිරිපත් කිරීම.
- අස්වැසුම වැඩසටහන මගින් ලබා දෙන ආධාර වඩා පුළුල් කිරීමට සැලසුම් කිරීම.
- මධ්‍යකාලීන අයවැය වැඩසටහන නැවත ආරම්භ කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති යෝජනා අනුමත කිරීම හා මුදල් වෙන් කිරීම.

අභියෝග

- රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කරණය කිරීම.
- රාජ්‍ය බදු ඉහළ දැමීම නිසා ජනතාව වෙත බදු බර වැඩි වීම.
- රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම.
- ආර්ථික දුෂ්කරතාවයට ලක් වූ ජනතාව සඳහා සහන ලබා දීම.
- අඛණ්ඩ හා ගුණාත්මක සෞඛ්‍ය සේවයක් තහවුරු කිරීම සඳහා මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම.

### 2.1.2 ඉදිරි ඉලක්ක

ඉහත දක්වා ඇති ප්‍රතිපත්තිමය තීරණ මත පදනම්ව 2023 වසරේදී අවශ්‍ය උපායමාර්ග 2023 වසරේදී තවදුරටත් සිදුකරමින් ස්ථාවර ආර්ථික තත්වයක් කරා ශ්‍රී ලංකාව මෙහෙය වීම ප්‍රධාන ඉලක්කය වේ.

එසේම 2022 වසරේ පළමු කාර්තුවේ සිට අඛණ්ඩව ආර්ථිකයේ සංකෝචනය වීම් වාර්තා කිරීමෙන් අනතුරුව, 2023 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇත. 2023 වසරේ අවසාන කාර්තුව තුළ ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් අඛණ්ඩව වර්ධනය වීමක් ඉදිරි ආර්ථික දර්ශක මගින් පෙන්නුම් කෙරේ. 2024 වසරේදී වාර්ෂික ආර්ථික වර්ධනය ධනාත්මක වනු ඇත. එය මැදි කාලීනව එහි විභව මට්ටමට ළඟාවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අනුව රජයේ සේවය ප්‍රතිව්‍යුහගතකරණය, සේවක සංඛ්‍යාව පිළිගත් නිර්නායක මත පදනම්ව කළමනාකරණය කිරීම, සුබසාධක වැඩසටහන් මගින් තෝරාගත් පිරිස් සඳහා 2023 වසරේ සිට පවත්වාගෙන යනු ලබන වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම, හා අනෙකුත් ආර්ථික උපායමාර්ග තුළින් ආර්ථික ස්වාධීනත්වයට ළඟාවීම ඉලක්ක කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කර ඇත.

**ලේකම්, (වැ.බ.)**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

ඒ. කේ. සෙනෙවිරත්න
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්,
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

# 03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 | | සටහන | තතය 2023 | 2022 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 54,374,983,038 | 1,814,034,102 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 3,458,503,757 | 561,733,405 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 33,092,275 | 28,342,232 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | 19,529,944 | 19,515,207 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **57,886,109,014** | 2,423,624,946 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **57,886,109,014** | 2,423,624,946 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 1,441,737,294 | 161 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 56,444,371,720 | 2,423,624,786 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ-2(ii) |
| 444,181,500 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 405,591,699 | 495,689,568 | ඒසීඒ-2(ii) |
| 1,147,293,087 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 733,181,829 | 704,327,251 | ඒසීඒ-2(ii) |
| 55,559,681,900 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 52,469,853,053 | 418,073,383 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 1,000,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 156,626 | 455,956 | ඒසීඒ-2(ii) |
| 57,152,156,487 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **53,608,783,206** | 1,618,546,158 | |
| | **මූලධන වියදම්** | | | | |
| 58,200,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 22,885,305 | 7,010,051 | ඒසීඒ-2(ii) |
| 981,043,500 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 806,185,330 | 62,301,300 | ඒසීඒ-2(ii) |
| 24,300,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 17,033,000 | 50,978,000 | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 25,443,000 | හැකියා වර්ධනය | 14 | 11,547,859 | 4,139,585 | ඒසීඒ-2(ii) |
| 1,183,174,700 | වෙනත් මූලධන වියදම් | 15 | 371,350,229 | 1,119,702,558 | ඒසීඒ-2(ii) |
| 2,272,161,200 | **මුළු මූලධන වියදම් (උ)** | | **1,229,001,724** | 1,244,131,494 | |
| | තැන්පතු ගෙවීම් | | 3,069,923,232 | 533,842,802 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 29,238,772 | 27,098,215 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | 120,550 | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | 3,099,282,555 | 560,941,017 | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 57,937,067,484 | 3,423,618,669 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (1,492,695,764) | (999,993,883) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (1,492,695,764) | (999,993,883) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | - | ඒසීඒ-3 |
| | | | (1,492,695,764) | (999,993,883) | |

1

## 3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | කතය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 14,414,398,865 | 14,383,952,957 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 63,945,479 | 85,694,633 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **14,478,344,344** | **14,469,647,590** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (570,141,823) | (177,747,571) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 14,414,398,865 | 14,383,952,957 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | 17,935,426 |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 634,087,302 | 245,506,778 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **14,478,344,344** | **14,469,647,590** |

පිටු අංක 6 සිට 55 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 56 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| ........................ | ........................ | ........................ |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2024.02.26 |
| දිනය : 27/02/2024 | දිනය : 2024.02.26 | |

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

ඩබ්.එස්. පුල්ලපෙරුම
අතිරේක ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ඒ.ඒ.ටී.කේ. අදිකාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
2 මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

## 3.2 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහ | |
|---|---|---|
| | **2023** රු. | **2022** රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 19,409,394 | 19,515,207 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 54,374,983,038 | 1,814,034,102 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 19,573,899 | 26,873,726 |
| තැන්පතු ලැබීම් | 3,458,503,757 | 559,514,927 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **57,872,470,088** | **2,419,937,962** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,117,167,415 | 964,402,030 |
| සහනාධාර සහ මාරුකිරීම් | 51,906,889,692 | 36,651,151 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 178,956,448 | 45,190,074 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 1,441,737,294 | 161 |
| අත්තිකාරම් ගෙවීම් | 15,530,357 | 25,868,728 |
| තැන්පතු ගෙවීම් | 3,069,923,232 | 533,842,802 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **57,730,204,438** | **1,605,954,946** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **142,265,650** | **813,983,016** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| මූලධන වියදම් | 142,265,650 | 813,983,016 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **142,265,650** | **813,983,016** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(142,265,650)** | **(813,983,016)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

### 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තාකිරීමේ පදනම**

**<u>1) වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>**

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**<u>2) මිනුම්කරණ පදනම</u>**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**<u>3) ආදායම් හඳුනාගැනීම</u>**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**<u>4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**<u>5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**<u>6) මුදල් හා මුදල් සමාන දෑ</u>**

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ % ලෙස |
| | අදාල නොවේ | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම (රු.) | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය (රු.) | අවසාන ප්‍රතිපාදනය (රු.) | | |
| පුනරාවර්තන | 1,276,535,000.00 | 57,152,156,487.00 | 53,608,783,206.00 | 93.8% |
| ප්‍රාග්ධන | 2,225,900,000.00 | 2,272,161,200.00 | 1,229,001,724.00 | 54.08% |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය | සිනෝ ලංකා ගොඩනැගිල්ලේ කුලියේ කොටසක් ගෙවීම් කිරීමට | 67,192,620.80 | 67,192,621.80 | 67,192,620.30 | 100% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය | සිනෝ ලංකා ගොඩනැගිල්ලේ විදුලිය හා ජල ශාස්තු කොටසක් ගෙවීමට | 11,867,500.00 | 11,867,500.00 | 11,337,933.86 | 95.54% |
| 03 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | සී.ආර්.මනම්පේරි මයා,ඩබ්.එන්.ඩී. සිල්වා මිය, ඩී.කේ.එන්. මුතුමාලි මිය යන අයගේ ණය ශේෂ නිරවුල් කිරීම සඳහා | 425,894.05 | 425,894.05 | 425,894.05 | 100.00% |
| 04 | කර්මාන්ත අමාත්‍යාංශය | ජාතික ලුණු සමාගමට මේස ලුණු නිශ්පාදන යන්ත්‍රයක් මන්තායි ලුණු සමාගමේ පිහිටුවීමට අදාලව ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා | 100,000,000.00 | 100,000,000.00 | 100,000,000.00 | 100.00% |

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 3,755,666,953.96 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 2,217,735,778.65 | - | |
| 9153 | ඉඩම් | - | 8,389,900,000.00 | - | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 51,096,132.08 | - | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | |

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

## 04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| සැලසුම් කළ දේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව | √ | | |
| ලැබුණු විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව | √ | | |
| ලැබුණු විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව | √ | | |
| රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කළ විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව | √ | | |
| පත් කළ භාණ්ඩාගාර නියෝජිතයන් සංඛ්‍යාව | √ | | |
| ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා සංඛ්‍යාව | √ | | |

- රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් රජයේ ගිණුම් කටයුතු විධිමත් පරිදි පවත්වා ගැනීම, මූල්‍ය මෙහෙයුම් කටයුතු අධීක්ෂණයට පියවර ගැනීම, එම ආයතන සම්බන්ධව සේවක බඳවා ගැනීම් ආදී කටයුතු සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

- රේඛීය අමාත්‍යාංශය ලෙස රාජ්‍ය ව්‍යාවසායන්හි සමස්ථ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීම හා අධීක්ෂණය අදාළ කාලසීමාවන්හිදී සිදු කර ඇත.

- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිබඳ ප්‍රශස්ථ කාර්යසාධනය සහතික කිරීම සිදු කර ඇති අතර අදාළ කෝප් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීමෙන් අනතුරුව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සහ පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරකසභාවේ රැස්වීම් සඳහා සහභාගී වීම සිදු කර ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා මේ වන විටද ලැබෙමින් පවතින අතර ලැබී ඇති සියළු වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම, කමිටු සඳහා අමාත්‍යාංශ නියෝජිතයින් පත් කිරීම නිසි කාලය තුළ දී සිදු කරන ලදී.

- මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිබඳ අධීක්ෂණය කර අදාළ වාර්තා කාර්තුමය වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කර ඇත. මෙම තොරතුරු ඇතුලත් වාර්තා එම දෙපාර්තමේන්තු මගින් අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය ප්‍රගතිය වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

තිරසර සංවර්ධනයේදී මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදුකරනු නොලැබේ. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයට අයත් විවිධ දෙපාර්තමේන්තු මගින්, ජාතික වශයෙන් තිරසර ආර්ථික කළමනාකරණය උදෙසා විශේෂ දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර එමගින් ආර්ථික සම්පත් සඳහා සැම දෙනාටම ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කෙරෙන ප්‍රමුඛතාවයට යටත්ව ඒ ඒ අංශ වලට අදාළ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සිදුකරනු ලැබේ. එම ක්‍රියාවලිය තුළට තිරසර සංවර්ධන ඉලක්ක සැපිරීමට අවශ්‍ය පියවරද අන්තර්ගත කර ඇත.

මෙහිදී මූල්‍යමය ප්‍රතිපත්ති හා ප්‍රතිපාදන වෙන් කිරීම, සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17 ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මගින්  සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස්, මග පෙන්වීම් හා ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මගින් ලබා දේ.

### 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.

2023 වසරේ පැවති රාජ්‍ය මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් රජයේ සංවර්ධන ව්‍යාපෘති හා සමාජ සුබසාධන කටයුතු සම්බන්ධ සියළු වැඩසටහන් ප්‍රතිසමාලෝචනයක් සිදු කරන ලදී. එමගින් අත්‍යාවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාළව ප්‍රමුඛතා හඳුනාගත් අතර රාජ්‍ය මූල්‍ය පාලනය සඳහා වියදම් කළමණාකරණ ප්‍රතිපත්තියට මූලිකත්වය ලබා දෙමින් උපාය මාර්ගික සංවර්ධන කටයුතු පවත්වා ගැනීමට පියවර ගෙන ඇත.

පැවති ප්‍රායෝගික දුෂ්කර ආර්ථික තත්වය යටතේ සමාජ සාධාරණත්වය තහවුරු කිරීම හා දරිද්‍රතාවය අවම කිරීමටත්, ජනතාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වයන් නිසි පරිදි පවත්වා ගැනීම මගින් යහපත් ජීවන තත්වයක් ලබා දීම සඳහා වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව සමෘද්ධි සහනාධාර හා ජීවන ආධාර අපේක්ෂිතව සිටින පවුල් සඳහා අස්වැසුම වැඩසටහන යටතේ සංක්‍රාන්තික පවුල් ලක්ෂ 4ක් සඳහා රු 2,500 බැගින්ද, අවදානමට ලක්වූ පවුල් ලක්ෂ 4ක් සඳහා රු 5,000 බැගින්ද, දුප්පත් පවුල් ලක්ෂ 8ක් සඳහා රු 8,500 බැගින්ද, අන්ත දිළිඳු පවුල් ලක්ෂ 4ක් සඳහා රු 15,000 බැගින්ද මාසික ආධාර, ලක්ෂ 20ක පමණ ජනතාවක් වෙත ලබා දීමට සැලසුම් කර තිබූ අතර අයදුම්පත්‍ර සලකා බලා ලක්ෂ 17ක පමණ පිරිසකට 2023 වසර පුරා එකී අයුරින් සහනාධාර ලබා දෙන ලදී. තවද, අස්වැසුම වැඩසටහන සඳහා සුදුසුකම් නොලැබූවන් සඳහා අභියාචන ඉදිරිපත් කිරීම සඳහා කාලසීමාවක් ලබා දුන් අතර එම අභියාචන සලකා බලන තුරු එතෙක් සමෘද්ධි, ආබාධිත, වකුගඩු හා වැඩිහිටි දීමනා ආදී දීමනා ලැබූවන් සඳහා එතෙක් ලැබූ එම දීමනා එලෙසින්ම ලබා දීමටත් කටයුතු කරන ලද අතර අභියාචන සලකා බලා ලක්ෂ 24ක පමණ පිරිසක් වෙත 2024 වර්ෂයේදී අස්වැසුම ප්‍රතිලාභ ලබා දීමටත් එම වැඩසටහන වසර 3ක කාලයක් පවත්වාගෙන යාමටත් කටයුතු සිදු කර ඇත.

පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් හඳුනාගත් පාසල්වල දරුවන්ට දිවා ආහාර ලබා දීම හා ගර්භනී මව්වරුන්ට ආධාර ලබා දීමද අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. තිරසර සංවර්ධන ඉලක්ක 01, 02, 03 හා 04 සඳහා ප්‍රමුඛත්වය ලබා දීම රජයේ ප්‍රධාන වගකීමක් වශයෙන් සලකා නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවය හැකි පමණින් ගුණාත්මකව පවත්වා ගැනීමට අවශ්‍ය සියළු ප්‍රතිපාදන ලබා දෙමින් අත්‍යාවශ්‍ය සෑම වැඩසටහනක්ම ක්‍රියාත්මක කර, ආර්ථික අර්බුදය හමුවේ වුවත් අත්‍යාවශ්‍ය සේවාවන් හැකි පමණින් සෞඛ්‍ය අංශ වෙත ලබා දීමට අරමුදල් වෙන් කරන ලදී.

විදේශ ණය මත යැපීම් නතර කිරීමට සිදුවූ තත්වය මත වුවත් දේශීයව පැවති මූල්‍ය අර්බුදය හමුවේ නව සංවර්ධන ව්‍යාපෘති හරහා යටිතල පහසුකම් තවදුරටත් දියුණු කිරීමටත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු පිළිබඳවත් රජය මැදිහත් වූ අතර ජනතාවගේ ජීවන තත්වය පවත්වාගෙන යාමට අනුකූලව වූ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැඩි අවධානය යොමු කර ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර හා අධීක්ෂණය යටතේ යහපත් ජීවන තත්වයක් ජනතාවට ලබා දීමටත් ආර්ථික දුෂ්කරතා අවම කිරීමටත් හැකිවන පරිදි එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සක්‍රියව දායක වන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහාය හා කෘෂි කර්මාන්තයට අදාළ සහන ලබා දීමට වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන් ආරක්ෂා කිරීමට අදාළ කටයුතු සිදු කරන ලද අතර මේ පිළිබඳව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය හා අනෙකුත් වානිජ බැංකු සම්බන්ධ කරගනිමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර සමාජ ආර්ථික තත්වය පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ප්‍රමුඛ අරමුණු වන්නේ තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම්ව ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ආර්ථික කටයුතු මෙහෙයවීමයි. ඒ අනුව ආර්ථික සංවර්ධනය උදෙසා අමාත්‍යාංශයේ මෙහෙවර තහවුරු කිරීමට අවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති 2023 වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලදී.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 62 | 35 | 27 |
| තෘතීයික | 07 | 05 | 02 |
| ද්විතීයික | 149 | 128 | 21 |
| ප්‍රාථමික | 162 | 151 | 11 |
| එකතුව | **420** | **311** | **109** |

### 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ සේවා අවශ්‍යතාවයන් පවතින සේවක සංඛ්‍යාව මගින් කළමනාකරණය කරගන්නා ලදී.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබා ගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ITEC : International Programme of Cooperate government & Leadership for Executives from the Financial System at the National Institute of Bank Management | 01 | 2023.03.06-2023.03.11 | | | විදේශීය | |
| Seminar on Government Effectiveness and Efficiency for Developing Countries | 01 | 2023.07.10-2023.07.23 | | | විදේශීය | |
| Seminar on Human Resources for Developing Countries | 01 | 2023.07.12-2023.07.25 | | | විදේශීය | |
| ADB: Call for Nominations of Government Representatives to the 2023 Asia Clean Energy Forum | 01 | 2023.07.13-2023.07.16 | | | විදේශීය | |
| Fintech Market Development and Policy Implications (FINTECH) | 02 | 2023.07.17-2023.07.21 | | | විදේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ADB: Request for Nominations for the Regional Workshop on Aligning Climate Change and Disaster Risk Management Actions in South Asia | 01 | 2023.07.27-2023.07.29 | | | විදේශීය | |
| Seminar on Enhancing Performance of Young Officials in Developing Countries (AIBO) | 02 | 2023.08.16-2023.08.29 | | | විදේශීය | |
| Green Public Procurement & Eco Lable for Circular Economic - Regional Knowledge Exchange | 01 | 2023.08.29-2023.08.30 | | | විදේශීය | |
| Seminar on the Construction and Management of Industrial Park for Sri Lanka | 01 | 2023.10.13-2023.10.26 | | | විදේශීය | |
| Training Programme for Women's Economic Empowerment Policy Makers | 01 | 2023.10.15-2023.10.25 | | | විදේශීය | |
| Seminar on Poverty Reduction and Development under the Global Development Initiative | 01 | 2023.10.18-2023.10.27 | | | විදේශීය | |
| Seminar on Poverty Eradication and Rural Revitalization for Countries around the Indian Ocean | 02 | 2023.11.07-2023.11.20 | | | විදේශීය | |
| Advanced Seminar for Financial Leaders from the Perspective of the Belt and Road Initiative | 01 | 2023.12.01-2023.12.08 | | | විදේශීය | |
| Seminar on Development of Tea Culture and Tea Industry for Developing Countries - AIBO | 02 | 2023.11.15-2023.12.05 | | | විදේශීය | |
| Seminar on Trade Facilitation for the "Belt and road Initiative Countries | 01 | 2023.11.08-2023.11.21 | | | විදේශීය | |
| Seminar on Economic Diplomacy AIBO | 01 | 2023.11.23-2023.12.06 | | | විදේශීය | |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත් කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සඳහා වන දෙමළ පාඨමාලාව | 40 | 2023.10.11-සිට පැය 100 | රු 75,000 | | දේශීය | |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | - | | |
| 2 | පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445) | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මූ.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| 8 | වත්කම් කළමනාකරණය | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙත ඉදිරිපත් කිරීම | | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | බැංකු ගිණුම් කළමනාකරණය | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අදාල නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | ප්‍රතිපාදන උපයෝජනය | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | පොදු තැන්පත් ගිණුම | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | අග්‍රිම ගිණුම | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | ආදායම් ගිණුම | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාල නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නොවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | | |
| **16** | මානව සම්පත් කළමනාකරණය | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | මහජනයා වෙත තොරතුරු ලබා දීම | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ. | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |